www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ “සාම ක්‍රියාදාමයේ” අවසානය

## The end of the Sri Lankan "peace process"

**කේ. රත්නායක විසිනි**
**2009 පෙබරවාරි 9**

දේශපාලන නරුමත්වය වෙනුවෙන් ජාත්‍යන්තර ත්‍යාගයක් පිරිනැමෙන්නේ නම්, ශ්‍රී ලංකාවේ ඊනියා සාම ක්‍රියාදාමයේ සම-සභාපතිවරු -- එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ -- ප්‍රමුඛ තරගකරුවන් වනු ඇත. පසුගිය සතියේ නිකුත් කෙරුනු ඒකාබද්ධ ප්‍රකාශයකින්, සම-සභාපතිවරු සිවුදෙනා, වොෂිංටනයේ නව ඔබාමා පාලනාධිකාරය විසින් තල්ලු කරනු ලදුව, අපක්ෂපාතිත්වය පිලිබඳ මොන යම් හෝ මවාපෙන්වීමක් අතහැර දමා, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයෙන් ඉල්ලා සිටියේ, සිය අවි බිම තබා ශ්‍රී ලංකා තන්ත්‍රයට යටත් වන ලෙසය.

සටන තුල සිවිල් වැසියන්ගේ ඉරනම පිලිබඳ කුහක උත්සුකතාවයෙන් සරසන ලද ප්‍රකාශය එල්ටීටීඊයෙන් ඉල්ලා සිටියේ, “අවි බිම තැබීම, ප්‍රචන්ඩත්වය අතහැර දැමීම, ශ්‍රී ලංකා ආන්ඩුවෙන් යෝජනා කෙරෙන ක්ෂමාව පිලිගැනීම සහ සාධාරන හා කල්පවතින දේශපාලන විසඳුමක් සාක්ෂතා කරගැනීමේ ක්‍රියාදාමයක් තුල දේශපාලන පක්ෂයක් ලෙස සහභාගි වීම ඇතුලු, එදිරිවාදුකම් අවසන් කිරීමේ කොන්දේසි පිලිබඳව ශ්‍රී ලංකාවේ ආන්ඩුව සමග සාකච්ඡා කරන” ලෙසයි.

මීට වඩා මුග්ධ ප්‍රකාශයක් තිබිය හැකිද එක්සත් ජනපදයේ පිටුබලය සහිතව, ශ්‍රී ලංකා ආන්ඩුව, එල්ටීටීඊය සමග මොන යම් හෝ සාකච්ඡාවක් දැනටමත් ප්‍රතික්ෂේප කොට එය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ප්‍රකාශයට පත් කොට ඇත. පරිපූර්න හා කොන්දේසි විරහිත යටත්වීමකින් පමනක් ම යුද්ධය නතර කෙරෙනු ඇතැයි ජනාධිපති මහින්ද රාජපක්ෂ අවධාරනය කර තිබේ. රෝගී හා තුවාල ලැබූ ජනයා ඉවත් කර ගැනීමට ඉඩ සලසන “තාවකාලික යුද මුක්ත කාල පරිච්ඡේදයක්” සඳහා සම-සභාපතිවරු කර ඇති ඉල්ලීමක් පවා ඔහුගේ ආන්ඩුව ප්‍රතික්ෂේප කලේය. එය යෝජනා කරන ක්ෂමාව අදාල වන්නේ එල්ටීටීඊයේ පහල සාමාජිකත්වයට මිස එල්ටීටීඊ නායකත්වයට නොවේ. මේ සියල්ල ම, සාකච්ඡා, දේශපාලන සහභාගිත්වය සහ “සාධාරන හා කල් පවත්නා දේශපාලන විසඳුමක්” පිලිබඳ ඉල්ලීම් විහිලුවක් බවට පත් කරයි.

ප්‍රකාශය, එය නොකියන දේ සම්බන්ධයෙන් ගත් කල, එමෙන් ම කැපී පෙනෙන සුලු ය. එය සටන් වහාම නතර කිරීමක්, සියලු ශ්‍රී ලංකා හමුදා 2002 සටන් විරාමයේ රේඛා දක්වා ඉවත් කර ගැනීමක්, සහ 2002-03 ජාත්‍යන්තර අනුග්‍රහයෙන් යුක්ත සාකච්ඡා කරා ආපසු යාමක් එය ඉල්ලා නොසිටී. වෙනත් වචනවලින් කියතොත්, ඔවුන් වරක් අනුග්‍රහය දැක්වූ ඊනියා සාම ක්‍රියාදාමයේ රාජ්‍යතාන්ත්‍රික මෘදුභාවයන් අනුගමනය කිරීමක් සම-සභාපතිවරු තව දුරටත් නොකරති.

සම-සභාපතිවරුන්ගේ අශිෂ්ට කුහකත්වය කිසිවකුට හෝ මවිතයට කාරනාවක් නොවිය යුතුය. එක්සත් ජනපදය, යුරෝපා සංගමය, නෝර්වේ සහ ජපානය යන සියල්ලන් ම, ඒ හෝ මේ ආකාරයෙන්, වොෂිංටනයේ ව්‍යාජ “ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය යුද්ධයට” ද ඇෆ්ඝනිස්ථානයේ හා ඉරාකයේ එය පවත්වාගෙනයන නව-විජිතවාදී වාඩිලෑමට ද පිටුබලය සපයා ඇත. ශ්‍රී ලංකාවේ “සාම ක්‍රියාදාමයට” ඔවුන් දුන් සහයෝගය මෙහෙයවුනේ දිවයිනේ ජනතාව 25 වසරක් අත්විඳි වේදනා සම්බන්ධයෙන් පැවති උත්සුකතාවකින් නොව, මහ බලවතුන්ගේ, අන් සියල්ලටමත් වඩා එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ, ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා මගිනි.

ක්‍රියාදාම ගනනාවක් ම 2002 පෙබරවාරි 22 සටන් විරාමයට දායක විය. 2000 අප්‍රේල් හා මැයි මාසවල දී, එල්ටීටීඊය, මූලෝපායික අලිමංකඩ අල්ලා ගනිමින් හා යාපන අර්ධද්වීපයේ කොටු වී සිටි 50,000ක හමුදාව විනාශ කිරීමේ තර්ජනය මතු කරමින්, ශ්‍රී ලංකා හමුදාව මත ව්‍යසනකාරී මිලිටරි පරාජයන් මාලාවක් ම කඩාපාත් කලේය. ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග යුද උපකරන මිලදී ගැනීමට සහ මිලිටරියට හා ඇගේ පාලනයට මුක්කු ගසාගැනීමට පරිශ්‍රම දරන තතු තුල, ඇගේ ආන්ඩුව ප්‍රගාඪ දේශපාලන හා ආර්ථික අර්බුදයක් තුලට ඇද වැටුනි.

2001 සැප්තැම්බර් 11න් පසුව, එක්සත් ජනපදයේ “ත්‍රස්ත විරෝධී යුද්ධයේ” ඉලක්කයක් බවට පත්වීමේ වේදනාව යටතේ, එල්ටීටීඊය තමන්ගේ කොන්දේසි යටතේ සාකච්ඡා මේසයට තල්ලු කර ගැනීමේ අවස්ථාව, ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූවේ කොටස් දුටුවහ. කුමාරතුංග එයට ප්‍රතිරෝධය දැක්වූ කල, ඇගේ ආන්ඩුවට සිය පාර්ලිමේන්තු බහුතරය අහිමි වූ අතර ප්‍රතිවාදී එක්සත් ජාතික පක්ෂය (එජාප) මැතිවරනය ජයගෙන සටන් විරාම ගිවිසුම අත්සන් කලේය.

එක්සත් ජනපදය කොන්දේසි සහිතව සාම ක්‍රියාදාමයට සහයෝගය දුන්නේය. තමන් ශීඝ්‍රයෙන් සමීප ආර්ථික හා මූලෝපායික සබඳතා වර්ධනය කර ගනිමින් සිටි, අසල්වැසි ඉන්දියාව තුල ශ්‍රී ලංකාවේ යුද්ධය මගින් ඇති කෙරෙන බලපෑම පිලිබඳව වොෂිංටනය උත්සුක විය. යුද්ධයෙන් විනාශයට පත් වූ දිවයින තුල සාමය, ප්‍රජාතන්ත්‍රවාදය හා සෞභාග්‍යය උදාවීම ද සෙසු ලෝකයාට ආදර්ශයක් ද ලෙස සටන් විරාමය වහාම ජාත්‍යන්තරව ප්‍රශංසාවට ලක්කෙරුනි. සම-සභාපතිවරු, දේශපාලන ආනුභාවය අත්පත් කරගැනීමේ විධික්‍රමයක් ලෙස ඩොලර් බිලියන 4.5ක යලිගොඩනැගීමේ ආධාර ලබා දීමට පොරොන්දු වූහ.

කෙසේවෙතත්, ඉක්මනින් ම ඔප්පු වූයේ, සම-සභාපතිවරු දෙපාර්ශ්වයට සමානයන් ලෙස සැලකීමක් නම් නොකරන බවයි. එල්ටීටීඊයට පක්ෂපාතී නැඹුරුවක් පිලිබඳ කොලඹ සිංහල අන්තවාදීන් රුදුරු ලෙස පැමිනිලි කලත්, ක්‍රියාදාමය නිරන්තරයෙන් ම එල්ටීටීඊයට එරෙහිව බොහෝ සෙයින් නැඹුරු විය. සාකච්ඡා ආරම්භ කිරීමට පෙර පවා, උතුරේ හා නැගෙනහිර වෙනම දෙමල රාජ්‍ය කැබැලිත්තක් පිලිබඳ සිය ඉල්ලීම ආකාරගත ලෙස අතහැර දැමීමට එල්ටීටීඊයට බල කෙරුනි. එල්ටීටීඊ යාත්‍රා ගිල්වාලූ නාවික ප්‍රකෝපකරන මාලාවකට පසුව, දේශපාලන විසඳුමක් පිලිබඳ කතා කිරීමක් ඇරඹීමකින් පවා තොරව, 2003 අප්‍රේල් මාසයේ දී සාකච්ඡා බිඳවැටුනි. සාකච්ඡා මුලුමනින් ම කඩාවැටීමට හේතු වූ අවසන් ප්‍රහාරය වූයේ සිය ත්‍රස්තවාදී සංවිධාන ලැයිස්තුවෙන් එල්ටීටීඊය ඉවත් කිරීමට එක්සත් ජනපදය ප්‍රතික්ෂේප කිරීමයි, එනයින් වොෂිංටනයේ පැවති සාකච්ඡාවලට එය සහභාගි වීම වැලැක්වීමයි.

යුද්ධය අවසන් කරනු පිනිස සාකච්ඡා කිරීමේ මීට පෙර පැවති සියලු ප්‍රයත්නයන් මෙන් ම, 1948 පටන් සිය පාලනය සිංහල අධිපතිවාදී දෘෂ්ටිය මත පදනම් කර ඇති ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්ථාපිතය, මොන යම් හෝ සහනයක් දීම සම්බන්ධයෙන් පවත්නා නොහැකියාව ඔප්පු කලේය. සිංහල හා දෙමල ප්‍රභූ කොටස් අතර බලය බෙදාගැනීමේ සැකැස්මක් සලකාබැලීම පවා ජාතිය පාවාදීමක් ලෙස නම් කරමින්, ජනාධිපති කුමාරතුංග, මිලිටරිය සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි සිංහල ස්වෝත්තමවාදී පක්ෂ විසින් එජාප ආන්ඩුව හෙලාදකින ලදි. කුමාරතුංග අවසානයේ 2004 දී ආන්ඩුව බලයෙන් පහකලාය.

තිරයට පිටුපසින්, ශ්‍රී ලංකා මිලිටරිය, එක්සත් ජනපදයේ හා සෙසු මිතුරන්ගේ සහාය සහිතව, යලි සන්නද්ධ වීම හා සිය බිඳවැටුනු බලවේග යලි පුහුනු කිරීම සඳහා සටන් විරාමය යොදා ගත්තේය. වොෂිංටනය සාම ක්‍රියාදාමය ගැන කටින් බතල කොල සිටුවීම දිගටම කරගෙන ගිය අතරතුර, ඉහල පෙලේ ඇමරිකානු රාජ්‍යතාන්ත්‍රිකයන් හා ජෙනරාල්වරු ගනනාවක් ම කොලඹ සංචාරවල යෙදුනු අතර මිලිටරි ගිවිසුම් ද අත්සන් කරන ලදි. ජවිපෙ සහයෝගය සහිතව 2005 අග දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරනයෙන් යන්තම් ජයගත් කල, යුද්ධය යලි දියත් කිරීමක් සඳහා වේදිකාව සැකසී තිබුනි.

ශ්‍රී ලංකා මිලිටරියට වාසි වන පරිදි 2002 සටන් විරාම ගිවිසුම යලි ලිවිය යුතු යයි රාජපක්ෂ ආන්ඩුව අවධාරනය කල තතු තුල, සාම සාකච්ඡා යලි ඇරඹීමේ බෙලහීන උත්සාහයන් ද 2006 අප්‍රේල් මස වන විට බිඳවැටුනි. එහෙත් එහි ඉරනම ඒ වන විටත් ලියැවී තිබුනි. ප්‍රකෝපකාරී ඝාතන හා පැහැරගැනීම් මාලාවක් මගින් සංඥා කෙරුනේ, රාජපක්ෂ, එහි ඝාතක කල්ලි හා පැරා-මිලිටරි කන්ඩායම් ද සමග, මිලිටරිය බැම්මෙන් මුදා හැර තිබූ බවයි.

2006 ජනවාරියේ දී, එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලන්ස්ටඩ්, එල්ටීටීඊය ප්‍රචන්ඩත්වය අතහැර දමා අවි බිම තැබුවේ නැතිනම් "වඩා ශක්තිමත්, වැඩි හැකියාවකින් යුක්ත හා වඩා අධිෂ්ඨානවත් ශ්‍රී ලංකා මිලිටරියකට" එය මුහුන දෙනු ඇතැයි අනතුරු ඇඟවීම මගින්, යුද්ධය සඳහා වොෂිංටනයේ සහයෝගය ඒ වන විටත් සංඥා කර තිබුනි. මිලිටරි සහයෝගයෙන් පමනක් නොව, එල්ටීටීඊය තහනම් කරන ලෙස යුරෝපා සංගමයට හා කැනඩාවට බල කිරීමේ ද එනයින් දෙමල විදේශගත ප්‍රජාව වෙතින් එයට ලැබුනු අත්‍යවශ්‍ය දේශපාලන හා මූල්‍ය සහයෝගය කපා හැරීමේ ද රාජ්‍යතාන්ත්‍රික ව්‍යාපාරයකින් එක්සත් ජනපදය සිය තර්ජනයට පිටුබලය සැපයීය.

සුලු හෝ මධ්‍යස්ථභාවයකින් යුක්තව පසුගිය දෙවසර තුල සිද්ධීන් නිරීක්ෂනය කර ඇති ඕනෑම කෙනෙක් සම-සභාපතිවරුන්ගේ මෑතම ප්‍රකාශය මගින් පුදුමයට පත් නොවනු ඇත. ශ්‍රී ලංකා මිලිටරියේ වඩාත්ම දුෂ්ට සහගත අපරාධ පිලිබඳ විටින් විට ඉදිරිපත් කෙරෙන ඇල් මැරුනු විරෝධතා සමග ම සිය භූමි ප්‍රදේශ ආරක්ෂා කරගැනීමට උත්සාහ කිරීම සම්බන්ධයෙන් එල්ටීටීඊය හෙලාදැකීම ද සිදු කරනු ලැබ ඇත. රාජපක්ෂ ආන්ඩුව 2002 සටන් විරාමය විවෘතව උල්ලංඝනය කරමින් 2006 ජුලි සිට එක පිට එක ප්‍රහාරක මෙහෙයුම් දියත් කල විට ද අවසානයේ පසුගිය වසර මුල එම ගිවිසුම මුලුමනින්ම ඉරා දැම්ම විට ද එක්සත් ජනපදය සහ එහි සම-සභාපති සගයෝ ආන්ඩුව පිලිබඳ කිසිදු විවේචනයක් නොකලහ.

සම-සභාපතිවරු අසරනව, අක්‍රීයව පසෙකට වී බලා සිටියේ නැත. ඔවුහු ශ්‍රී ලංකා ආන්ඩුවේ යුද්ධය ද උතුරු ශ්‍රී ලංකාවේ දැන් දිගහැරෙන මානුෂ්‍ය ව්‍යසනය ද සම්බන්ධයෙන් දේශපාලනික වගකීම දරන ක්‍රියාකාරී සහභාගිකරුවෝ ය. සිවිල් වැසියන් සිය ගනනක් ඝාතනයට ලක් කර ඇති ගාසා තීරයේ එක්සත් ජනපද පිටුබලය ලබන ඊශ්‍රායල ආක්‍රමනය මෙන්, ශ්‍රී ලංකාවේ යුද්ධය ද සිය ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා

ප්‍රවර්ධනය කරගනු වස් අධිරාජ්‍යවාදී බලවතුන් විසින් දැන් යොදා ගනු ලැබෙන සාපරාධී විධික්‍රම පිලිබඳ අනතුරු ඇඟවීමකි.

සමස්ත ක්‍රියාදාමයෙන් ම අවධාරනය කෙරෙන්නේ, එල්ටීටීඊයේ පසුබෑම් හුදු මිලිටරි කාරනාවක් නොව එහි දේශපාලන ඉදිරිදර්ශනයේ බංකොලොත්කමෙන් ම ගලා එන්නක් ය යන්නයි. 2002 දී එය ප්‍රෝඩාකාරී සාම ක්‍රියාදාමය වැලඳගැනීම ව්‍යාතිරේඛයක් නොව, ඒ හෝ මේ ප්‍රධාන අධිරාජ්‍යවාදී බලයක සහයෝගිය ලබාගැනීම මත නිරතුරුවම පාදක කෙරුනු ස්වාධීන ඊලමක් පිලිබඳ ක්‍රියාමාර්ගයක ප්‍රතිඵලය විය. අද, ආන්ඩුවේ යුද්ධයට පිටුබලය සපයන එම "ජාත්‍යන්තර ප්‍රජාවගේ" ම හොඳ හිතට නිෂ්ඵල ආයාචනා ඉදිරිපත් කිරීමේ එල්ටීටීඊය දිගටම යෙදී සිටී. දෙමල ධනේශ්වරයේ අවශ්‍යතා නියෝජනය කරන එහි දෙමල බෙඳුම්වාදය, ප්‍රජාතන්ත්‍ර අයිතීන් ස්ථිරසාර ලෙස ආරක්ෂා කිරීමේ හැකියාව පවතින එකම සමාජ බලවේගය, එනම් කම්කරු පන්තිය, වෙත මොන යම් හෝ ප්‍රවිෂ්ටයක් බැහැර කලේය.

සාම ක්‍රියාදාමයේ අවසන් අභාවය කොලඹ සිටින එහි ප්‍රමුඛතම අද්වකාත්වරුන් -- මධ්‍යම පන්තික රැඩිකල් සංවිධාන වන නව සමසමාජ පක්ෂය (නසසප) සහ එක්සත් සමාජවාදී පක්ෂය (එසප) -- පිලිබඳ බරපතල අධිචෝදනා පත්‍රයක් ද වේ. මෙම සමාජවාදී වෙස්පාන්නන්, "සාම" එන්ජීඕ (රාජ්‍ය නොවන සංවිධාන) සහ චින්තන පර්ශදවලින් සමන්විත කුඩා ව්‍යාපාරයක් සමග සහයෝගීව ක්‍රියාකරමින්, යුද්ධය අවසන් කිරීමේ එකම මාවත ශ්‍රී ලංකා ධනේශ්වරයේ ඒ හෝ මේ කන්ඩායම සහ ප්‍රධාන ජාත්‍යන්තර බලයන්ගේ යහපත් සේවාවන් මත බලාපොරොත්තු තැබීම පමනකි යන්න විශ්වාස කිරීමෙහිලා කම්කරුවන් හා තරුනයන් රවටාලීම මගින් ජීවිකාවක් නිර්මානය කර ගෙන තිබේ. ඔවුන්ගේ නවතම මිතුරා -- දක්ෂිනාංශික එජාපය -- රාජපක්ෂගේ ජයග්‍රාහී උත්සවවල අත්වැල් ගායනයට එක්වෙද්දී පවා, නසසප හා එසප අධිරාජ්‍යවාදී අනුග්‍රහය ලැබෙන සාම සාකච්ඡා යලි අරඹන ලෙස ඇවිටිලි කිරීමේ දිගටම යෙදී ගනී.

මේ කම්කරුවන් අවශ්‍ය නිගමන උකහා ගත යුතු අවස්ථාවයි. සැබෑ යුද විරෝධී අරගලයක් ගෙන යාමට නම්, කම්කරු පන්තිය ස්වකීය ශක්තිය මත පාදක විය යුතුය, ධනේශ්වරයේ සියලු කන්ඩායම්වලින් ස්වාධීනව බලමුලුගැන්වී, යුද්ධයේ මූල හේතුව, එනම් ලාභ ගරන පද්ධතිය ම, අහෝසි කරන සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත පාදක වී ගත යුතුය. ශ්‍රී ලංකාව තුල හා වඩාත් පුලුල් ලෙස දකුනු ආසියාව තුල සමාජවාදී සමානතා පක්ෂය විස්තාරනය කරමින් හා සටන් වදිමින් සිටින්නේ නිශ්චිතවම එවන් ඉදිරිදර්ශනයක් වෙනුවෙනි.

© www.wsws.org